


# බිංදුව පාඩමක්

නෙතුලි බිනන්සා ජයරත්න



# බිංදුට පාඩමක්

© නෙතුලි බිහන්සා ජයරත්න
කර්තෘ ප්‍රකාශනයකි.

සියලුම හිමිකම් ඇවිරිණි.

ප්‍රථම මුද්‍රණය - 2023
ISBN 978-624-206-786-5

කතාව හා චිත්‍ර
නෙතුලි බිහන්සා ජයරත්න
5 ශ්‍රේණිය
මහාමායා බාලිකා විදුහල - මහනුවර

පිටකවරය සහ පිටු සැලසුම
අසේල මහේෂ් කරුණාරත්න

මුද්‍රණය
නව ළහිරු මුද්‍රණාලය
අංක 01, දුම්රියපොළ පාර, ගම්පොල.
දුරකතන 0714 352545 | 077-1717274

# පිදුම

**"දිවිය දිනන විද්‍යුත් පොතක්"**

පාසල් ව්‍යාපෘතිය වෙනුවෙන්
මෙම ළමා කතා පොත නිර්මාණය කිරීමට
මා පෙළඹූ වූ
5-A ශ්‍රේණියේ මගේ ආදරණීය පන්ති භාර

**ගුරු මෑණියන්ටත්, විදුහල්පතිතුමියටත්,**

මා දිරිමත් කළ

**මගේ ආදරණීය අම්මාටත්, අප්පච්චිටත්,**
**අක්කාට හා නංගීටත්,**
**අත්තාට හා අත්තම්මාටත්**

මෙය උපහාරයක් වේවා....!

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023.1.01**

ඔන්න එකෝමත් එක ගමක හිටියා
බිංදු කියලා ළමයෙක්.
එයා හරිම දඟයි.
ඒ වගේම අකීකරුයි.
වැඩිහිටියන් කියන දේ අහන්නෙම නෑ.



එක දවසක් බිංදුගේ අම්මා පොළට යන්න සූදානම් වුණා.

"අම්මේ, මමත් එන්නද පොළට යන්න?" බිංදු ඇහුවා.




"අනේ පුතේ, පොළේ ගොඩාක් සෙනග ඉන්නවා. ඔයා අතරමං වෙයි. මම ඉක්මනට එන්නම්. මගෙ පුතා ආච්චිත් එක්ක ගෙදර ඉන්න." අම්මා කිව්වා.

"අනේ අම්මේ, මම අම්මාගේ ළඟින්ම ඉන්නම්. මට යන්න ම ඕනෑ.'' බිංදු තරහෙන් කිව්වා.


බිංදු කොහොම හරි අම්මත් එක්ක පොළට ගියා.

"පුතා මාත් එක්කම ඉන්න."
අම්මා අවවාද කළා.



පොළේ ගොඩාක් සෙනග හිටියා. බිංදුට ටිකක් බයත් හිතුණා. අම්මා පොළෙන් එළවළු පලතුරු ගත්තා. බිංදු ලස්සන සෙල්ලම් බඩු විකුණන වෙළෙන්දෙක් දැක්කා. ලස්සන ලස්සන සෙල්ලම් බඩු දැකලා බිංදුට ආස හිතුණා.


"අම්මේ මට අර සෙල්ලම් කාර් එක අරන් දෙනවද?" බිංදු ඇහුවා.




"අනේ පුතේ අද මගේ අතේ ගොඩක් සල්ලි නෑ. මම පුතාට ඒක වෙන දවසක අරන් දෙන්නම්." අම්මා කිව්වා.

අම්මා බඩු ගන්න අතරේ බිංදු හෙමින් හෙමින් සෙල්ලම් බඩු වෙළෙන්දා ළඟට ගියා.


"මාමේ, මට මේ කාර් එක දෙන්න පුලුවන්ද? මම අම්මගෙන් සල්ලි ඉල්ලලා ගෙනත් දෙන්නම්." බිංදු ඇහුවා.




"සෙල්ලම් බඩු ඕනනම් මුලින් ම සල්ලි අරගෙන එන්න." වෙළෙන්දා කිව්වා.

අම්මට කරදර කරල කොහොමහරි සල්ලි ඉල්ලගන්න හිතපු බිංදු වටපිට බැලුවා.


"කෝ අම්මා! පේන්න නෑනේ !'' බිංදු බයවුණා. එයාට ඇඬුණා.



පාරේ සිටි පොලිස් නිලධාරියෙක් බිංදු අඬ අඬා ඉන්නවා දැක්කා.

"ඇයි පුතේ අඬන්නේ?" පොලිස් නිලධාරියා ඇහුවා.

බිංදු ඔහුට විස්තරය කිව්වා.



බිංදුගේ අතින් අල්ලා ගත් පොලිස් නිලධාරියා පොළ පුරාම ඇවිදිමින් බිංදුගේ අම්මා හෙව්වා. ටික වේලාවකට පස්සේ හරිම කලබලයෙන් යමක් සොයමින් සිටි කාන්තාවක් පොලිස් නිලධාරියා දැක්කා.




පොලිස් නිලධාරියා බිංදුත් එක්කම එතැනට ගියා.

අම්මා හඬමින් බිංදුව වැළඳ ගත්තා.


බිංදුත් හයියෙන් අඬන්න පටන් ගත්තා.


බලාගෙන හිටිය හැමෝගෙම ඇස්වල කඳුළු පිරුණා.



බිංදුගේ අම්මා පොලිස් නිලධාරියාට ස්තූති කළා.

"හොඳ දරුවො නිතරම වැඩිහිටියන්ගේ අවවාද පිළිපදින්න ඕනෑ." පොලිස් නිලධාරියා බිංදුට අවවාද කළා.





එදා ඉඳන් බිංදු වැඩිහිටියන්ගේ අවවාද පිළිපදිමින් සතුටින් ජීවත් වුණා.

- ආදර්ශය -

හැමවිටම වැඩිහිටියන්ගේ අවවාද පිළිපදින්න.



# බිංදුට පාඩමක්

## නෙතලි බිහන්සා ජයරත්න

### පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඥුපිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
**සෙනෙවිරත්න මහලේකම්**
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01

ISBN 978-624-206-786-5

© කර්තෘ ප්‍රකාශනයකි.